# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2249/2 - 2021 ඔක්තෝබර් මස 11 වැනි සඳුදා - 2021.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය :* කේඩීඑස්/පිඩීබී/4/3/2/12.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :*-4-3/9/2015/WS/122.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩතලවින්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක මහ/7084 හා 2021.07.16 දිනැති මූලික පිඹුරේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0506 ක් පමණ වන කෝන්ගහකොටුව, ගම දෙර අරඹ සහ පොන්ඩාගොල්ල නැමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

ඉඩමේ නම : කෝන්ගහකොටුව, ගමදෙර අරඹ සහ පොන්ඩාගොල්ල; ප්‍රමාණය: 0.0506; *උතුරට:* ඩබ්ලිව්. විත්‍රානන්ද හිමකම් කියන හීන්කෙන්ද ගෙදර වත්ත; *නැගෙනහිරෑ:* කේ. එම්. මල්ලිකා කුලතුංග හිමිකම් කියන කෝන්ගහකොටුව, ගමදෙර අරඹ සහ පොන්ඩාගොල්ල (මෙම ඉඩමේ ඉතිරි කොටස); *දකුණට:* කේ. එම්. මල්ලිකා කුලතුංග හිමිකම් කියන කෝන්ගහකොටුව, ගමදෙර අරඹ සහ පොන්ඩාගොල්ල (මෙම ඉඩමේ ඉතිරි කොටස); *බටහිරට:* මාර්ග (ප්‍රාදේශීය සභා); හිමිකම් කියන අය: මල්ලිකා කුලතුංග, අංක 11, උඩතලවින්න.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021 දෙසැම්බර් මස 06 වැනි දින පෙ.ව. 10.00 ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2021 නොවැම්බර් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත්

G 35085 - 25 (2021/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ඩබ්. එම්. ටී. ඩී. කේ. වීරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2021 ඔක්තෝබර් මස 05 වැනි දින
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 -318

---

ශුද්ධිපත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*යොමු අංකය:* 2/2/1/සීඑච්/139.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/7/2016/එච්ඩබ්ලිව්/224.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2002/63 හා 2017.01.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ 9ඒ පිටුවේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 4012 හි කැබලි අංක 155 ලෙස සටහන් වන ඉඩම් කොටස මැනුම් සංශෝධන පරිදි කැබලි අංක 297 හා 298 ලෙසද, කැබලි අංක 156 කොටස කැබලි අංක 299 හා 300 ලෙසද කැබලි අංක 116 කොටස කැබලි අංක 301 හා 302 ලෙසද, විභජනය වී ඇති අතර, එම කැබලි වලට අදාල ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 297**
ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-25 ක් පමණ වයසැති පොල් ගසක්, අවුරුදු 30ක් පමණ වයසැති කොහොඹ ගසක්, අවුරුදු 10 ක් පමණ වයසැති කිතුල් ගසක් සහ අවුරුදු 25 ක් පමණ වයසැති අඹ ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. ඒ. පී. දිනේෂා සහ එස්. ආර්. වෙලගෙදර, ලිපිනය සොයාගත නොහැක, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0142.

02. **කැබලි අංක 298**
ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ඉදිවෙමින් පවතින ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, අවුරුදු 20-25 ක් පමණ වයසැති පොල් ගස් 3ක් සහ අවුරුදු 10-20 ක් පමණ වයසැති අඹ ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. ඒ. පී. දිනේෂා සහ එස්. ආර්. වෙලගෙදර, ලිපිනය සොයාගත නොහැක, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0292.

03. **කැබලි අංක 299**
ඉඩමේ නම: ඕවිටවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, තහඩු වලින් තනන ලද තාවකාලික ගොඩනැගිල්ලක කොටසක්, අවුරුදු 20 ක් පමණ වයසැති පොල් ගස් 10 ක් සහ අවුරුදු 15 ක් පමණ වයසැති මහෝගනී ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. ඒ. සී. පී. නිශ්ශංක, අංක. 105/සී, ජාඇල පාර, ගම්පහ, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0556.

04. **කැබලි අංක 300**
ඉඩමේ නම: ඕවිටවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, අවුරුදු 30 ක් පමණ වයසැති පොල් ගස් 15 ක්, අවුරුදු 4 ක් පමණ වයසැති පොල් ගස් 7 ක් සහ තේක්ක ගසක් අවුරුදු 30 ක් පමණ වයසැති කොස් ගසක්, අවුරුදු 20 ක් පමණ වයසැති අඹ ගස් 2 ක් සහ රඹුටන් ගස් 2 ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. ඒ. සී. පී. නිශ්ශංක, අංක. 105/සී, ජාඇල පාර, ගම්පහ, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.1354.

05. **කැබලි අංක 301**
ඉඩමේ නම: රුක්අත්තනගහකුඹුර ඉඩම; ඉඩමේ විස්තරය: ගෙවත්ත, වැසිකිලියක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඩී. සුමිත් හේමන්ත ධර්මදාස, අංක. 294/7, හංසගිරිවත්ත, ගම්පහ, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0005.

06. **කැබලි අංක 302**
ඉඩමේ නම: රුක්අත්තනගහකුඹුර ඉඩම; ඉඩමේ විස්තරය: ගෙවත්ත, වැසිකිලියක කොටසක් සහ අවුරුදු 25 ක් පමණ වයසැති පොල් ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. ඩී. සුමිත් හේමන්ත ධර්මදාස, අංක. 294/7, හංසගිරිවත්ත, ගම්පහ, (අත්කර ගැනීමේ කටයුතු අවසන් කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0101.

සී. පී. ඩබ්ලිව්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
ගම්පහ.

2021 ඔක්තෝබර් 08 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-319/1

ශුද්ධිපත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*යොමු අංකයඃ* 2/2/1/සීඑච්/139.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකයඃ* 4-3/7/2016/එච්ඩබ්ලිව්/224.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2002/63 හා 2017.01.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ 9ජ් පිටුවේ සඳහන් මූලික පිඹුරු අංක ගම් 4012 හි කැබලි අංක 154 සහ 165 ලෙස සටහන් වන ඉඩම් කොටස මැනුම් සංශෝධන පරිදි එම කැබලි වලට අදාල ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 154**

ඉඩමේ නමඃ සොයාගත නොහැක; ඉඩමේ විස්තරයඃ ගෙවත්ත, වැසිකිලියක්, සිමෙන්තියෙන් බඳින ලද සුනබ කුඩුවක් සහ අවුරුදු 10 - 15 ක් පමණ වයසැති පොල් ගස් 4 ක් ඇත; හිමිකම් කියන අයඃ රජය; මුල් හිමිකම් කියන අයඃ සොයාගත නොහැක, (අවසතු කිරීම සඳහා); ප්‍රමාණයඃ- හෙක්ටයාර් 0.0143.

02. **කැබලි අංක 165**

ඉඩමේ නමඃ රුක්අත්තනගහකුඹුර; ඉඩමේ විස්තරයඃ ගෙවත්ත, අර්ධ ස්ථිර ගොඩනැගිල්ලක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක්, වැසිකිලියක්, අවුරුදු 25 ක් පමණ වයසැති පොල් ගස් 4 ක්, අවුරුදු 20 ක් පමණ වයසැති අඹ ගස් 2 ක් සහ පුවක් ගසක් ඇත; හිමිකම් කියන අයඃ රජය; මුල් හිමිකම් කියන අයඃ ජේ. වී. සරත් නන්දසිරි සහ ස්වර්ණා පෙරේරා, අංක. 105, ජාඇල පාර, ගම්පහ, (අවසතු කිරීම සඳහා); ප්‍රමාණයඃ- හෙක්ටයාර් 0.0289.

සී. පී. ඩබ්ලිව්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
ගම්පහ.

2021 ඔක්තෝබර් 08 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-319/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.